# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven





FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 12
NUMBER 05

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

SEPTEMBER 10, 2009 සැප්තැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2553 බිනර මාසය)


# Silly Season හෙවත් විලම්බීත සමය

♦ සංජය විමලරත්න විසිනි

**සෑ**ම වසරකම ජූලි හා අගෝස්තු මාස මහා බ්‍රිතාන්‍යයේ මාධ්‍යකාරයින් හඳුන් වන්නේ සිලි සීසන් හෙවත් අමන, විලම්බීත සමය යනුවෙනි. ග්‍රීෂ්ම සෘතුවේ උපරිම රස් නය දැනෙන මේ සමයේ පාසැල් හා සරසවි වල දීර්ඝ නිවාඩු ලැබේ. පාර්ලිමේන්තුවද අවසන්වී මැති ඇමතිවරු ද නිවාඩු ගොස්ය. රැකියාවල නියුක්ත අයද වාර්ෂික නිවාඩු ගෙන සංචාරයේ යෙදෙති. කඩ සාප්පු හා ව්‍යාපාර ආදියේද වැඩ කටයුතු අඩුය. මේ නිසා මේ සමයේ දේශීය හා ප්‍රාදේශීය ප්‍රවෘත්තිද හිඟය. ලැබෙන්නේ පිටරට පුවත් පමණකි. පුවත්පත් වාර්තාකරුවන්ද නිවාඩු යති. මේ තත්වය යටතේ ඉතිරි වාර්තාකරු- වන් සහ උප කර්තෘවරුන් යම් කිසිවක් ලිවිය යුතු නිසා කියවන්නන්ට හාස්‍යය ගෙන දෙන විලම්බීත කතා ප්‍රවෘත්ති සමග මිශ්‍රකොට පළකරති. එමගින් පාඨකයින් ගේත් තමන්ගේත් කාන්සිය මගහරවති. මොවුන් මේ ලියන දෑ බොහෝවිට මඳක් දුර කියවාගෙන යනවිට විහිළු හෝ බොරුබව තේරී යන ආකාරයේ ඒවාය. කාටවත් වරදක් නොකරන සිනා ගෙනදෙන විනෝද සමයක සිදුවීම් වැනිය. මේ ගැන සිතමින් මෙහි සහ අප රට ලංකාවේද සිදුවුණු හා සිදුවෙමින් පවතින සිලිසීසන් වැඩ හෙවත් අමන විලම් බීත සිද්ධීන් ගැන කතාකිරීමට සිතුවෙමු.

බටහිර රටවල දැන් පවතින ආර්ථික දුෂ්කරතා නිසා සිලිසීසන් විහිළුවලට හිනා- වෙන්නට මිනිස්සුන්ට අමතකව ඇත. ඇප්ඝනිස්ථානයේ යුද්ධයෙන් බ්‍රිතාන්‍ය සොල්දාදුවෝ වැඩි වැඩියෙන් මරුමුවට යති. මෙය ගොඩ ඒමට බැරි යුද්ධයක් ලෙස දැන් සැලකේ. අපේ යුද්ධ සමයේ එයට කට දැමීමට පැමිණි පල්ලම් බැස්ස විදේශ ඇමති මිලිබෑන්ඩ් දැන් කොහේද කියාවත් නැත. වග කිව යුත්තෝ අන්ද මන්දව බලා සිටිති.

මෙහි දිනපතා පුවත් පත් මාධ්‍යයේ අවධානය යොමුවී ඇත්තේ ගෙවල් මිළ ගැනය. ආර්ථික අර්බුදය නිසා අන්තයටම වැටී ඇති ගෙවල් මිළ යළි ඉහළ නගීද? ආර් ථික පිබිදීමක් ඉක්මනින් ඇතිවේද? යන්න ගැන පාඨක ජනතාවද පුල පුලා බලා සිටිති.

මෙසේ තිබියදී නියම විලම්බීත ස්වරූපයේ දෙයක් මෙහි සිදුවූයේ ලංකාව සම්බන්ධයෙනි. දැනට සති දෙක තුකට පෙර දිනක මහා බ්‍රිතාන්‍යයේ චැනල් 4 රූපවාහිනී නාලිකාවේ සවස 7 ට කරන ප්‍රවෘත්ති විකාශනයේ අප රටේ පසුගිය යුද සමයේ එනම් 2009 ජනවාරි කාලයේ ශ්‍රීලංකා යුද හමුදාවේ භටයෙකු විසින් අල්ලාගත් දෙමළ සිවිල් වැසියන් දෙදෙනෙකුගේ දෑත් පිටිපසට තබා බැඳ, නිර්වස්ත්‍රකොට බිම වාඩිකරවා, පිටුපසින් වෙඩිතබා මරණු ලබන ආකාරය ශ්‍රීලංකාවෙන් රහසිගතව ලැබුණු බව කියන විඩියෝ පටියකින් ගත් දර්ශන යයි පෙන්වීය. මෙයට එංගලන්තයේ මාධ්‍යයෙන් විශාල ප්‍රචාරයක් ලැබුණි. එහෙත් මෙය විමසිල්ලෙන් බැලූ බොහෝ අයගේ අදහස වූයේ එය නිසැකවම සැබෑ දර්ශනයක් නොව, කොටි ත්‍රස්තවාදීන් කලකට පෙර නළුවන් යොදා තැනූ උන්ගේ ප්‍රචාරක විඩියෝ පටයක් බවයි.

ලංකා යුදභටයෙකු බවට සාක්ෂිවශයෙන් කියැවුණේ ඇඳ සිටි නිල ඇඳුම පමණකි. කොටි ත්‍රස්තවාදීන් ළඟ පැහැරගත් හමුදා භටයින්ගේ නිළ ඇඳුම් ඕනෑතරම් ඇත. ඒවා ඇඳගෙන කොටි රජයේ හමුදා කඳවුරුවලට ආ අවස්ථා කොතෙකුත් ඇත. ඒ වෙඩි කන සිවිල් වැසියන් ද ලංකාවේ අය නොවන බව හොඳින් පෙනුණි. භටයින් සිංහළ කතා කළත් ඒවා උච්චාරණය කළේ දෙමළ අය සිංහළ උච්චාරණය කරන ආකාරයටය. මේ සියල්ලෙන් පැහැදිලිව පෙනුණේ ඒ විඩියෝ කැල්ල අමූලික බොරුවක් හා රහපෑමක් බවයි. එහෙත් මේ කිසිවක් තෝරා බේරා ගන්නට නොදන්න චැනල් 4 කාරයා මෙය අපට ශ්‍රීලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී මාධ්‍ය කරු- වන් පිරිසක් දුන්නායයි කියා උණු උණු ප්‍රවෘත්තියක් ලෙස ඉදිරිපත් කළේය.

මේ කාරණය යොදාගෙන ශ්‍රීලංකාවට එරෙහි සංවිධාන පෙළගැසී ශ්‍රීලංකා හමුදා යුදමය නීති උල්ලංඝණය කිරීමේ වරදට එක්සත් ජාතීන්ගේ ඉදිරියට ගෙන යාමට පවා කතාකරන්නට පටන්ගත්හ. මෙය චැනල් 4 කාරයින්ට කවුරු හෝ දුන් ලණුවක්ද, නැත්නම් උන්ම කාගත් ලණුවක්දැයි දැන් සැක පහළවේ. පසුගිය යුද සමයේ චැනල් 4 ට සම්බන්ධ මාධ්‍යවේදියෙකු ලංකාවෙන් පන්නා දැමීම නිසා හටගත් තරහ උන් පිරිමහ ගන්නේ මෙවැනි වගකීමෙන් තොර විලම්බීත වැඩ කිරීමෙනි.

ශ්‍රීලංකාවේ සිටින බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් පීටර් හේස් ඊයෙ පෙරේදා සිලිසීසන් වැඩක් කළේය. එනම් අංගායති කානි ක්‍රිෂ්ණාපිල්ලේ නම් ද්‍රවිඩ තරුණියකට කිසිම වීසාවක් නැතිව ලන්ඩනයට ගමන්කිරීමට සැළැස්වීමේ සිද්ධියයි. ඇයට හීත්රෝ ගුවන්තොටුපළෙන් ඇතුල්වීමට සලස්වන ලියුමක්ද දී තානාපති කාර්‍යාලයේ නිලධාරියෙක්ද ඇය හා කටුනායකට ගොස් කෙළින්ම ලන්ඩන් යන ගුවන් යානයකට නැංවූ බව කියති. ලංකාවේ කට්ටි පනිමින් සිටින කොටි ත්‍රස්තවාදී අපරාධකරුවන් තව කී දෙනෙකුට දේශ සීමා අන්තර්ජාතික නීති රීති උල්ලංඝනය කරමින් පිටවී යන්නට සැලැස්සුවාදැයි අපි නොද නිමු. මුන් මේවා කරන්නේ අප රටේ නීතිය තුට්ටුවකටවත් නොසලකා හැල්ලුවට පත්කරමිනි. නීත්‍යානුකූලව බ්‍රිතාන්‍යයට එන්නට වීසා ඉල්ලා සිටි ශ්‍රීලංකා ක්‍රිකට්ට් ක්‍රීඩකයෙකුට (ප්‍රාන්ත කණ්ඩායමකට ක්‍රීඩාකිරීම සඳහා) සහ දේශපාලනඥයෙකුට වීසාදීම කොළඹ කාර්‍යාලයෙන් ප්‍රතික්ෂෙප කර ඇත. මේ බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කටයුතුකරන්නේ ඔහු එහාට පත්කර යවා ඇත්තේ කොටි ත්‍රස්තවාදීන් වෙනුවෙන්දැයි ප්‍රශ්න කළ යුතු ය. මේ ගැන වහා උත්තර සපයන ලෙසද, මේ සිද්ධිය ගැන විභාගකිරීමටද අපේ විදේශ අමාත්‍යංශයට පැමිණෙන ලෙස විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම මහතා


4 වෙනි පිට බලන්න ⟶



http://www. lankaheritage.com/lankaviththi/




නිලුපුල් අරුණ වට පිණි බිඳකින් තෙමුණී
මනවිල් එබී සැඩ හිරු හිරිහැර කෙරුණී
ගියකල් සෙනෙහෙ ඡායා දුර එනු පෙනුණී
එකඳුල් වහා හසරැල්ලක් වී පිපුණී

**Water-lilies in pond sprinkled with early morning dew**
**Are pestered by sudden harsh rays of sun's view**
**Emerging from afar an outline of long lost woo**
**Swiftly the tears disappeared bringing smiles anew**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*




ඔබේ මුදල් අදම යවන්න අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY



විස්තර පිටු අංක 3